# වියෝදුක සමනයෙහි ලා බුදුසමයේ උපයෝගීත්වය

ගලගම කරුණාකර හිමි[1]

හුදකලාව ජීවත්වීමට නොහැකි බැවින් විවිධ සමාජ සබඳතාවයන් ගොඩනගා ගනු ලබන පුද්ගලයා, තත් සබඳතා මඟින් මෙන්ම ආත්මීයව ලබන ලද විවිධ ආබාධයන් තුළින් දුකට පත්වේ. එය වියෝදුක යනුවෙන් අර්ථවත් කළ හැකිය. අත්මීය වශයෙන් ශාරීරික අවයව ආදිය අහිමි වීම, සාමාජීය වශයෙන් සබඳතා බිඳවැටීම, දේපල අහිමි වීම ආදිය නිසා වියෝදුක ඇති වේ. මෙය සමාජය තුළ විවිධාකාරයෙන් අර්ථ දක්වන අතර ඇතමුන් විරහා දුක ලෙසම අර්ථය ලඝු කළ ද එමඟින් වඩා පුළුල් අදහසක් ගම්‍ය වන බව අපගේ මතය යි.

මෙසේ විවිධාකාරයෙන් ඇතිවන වියෝදුක සමනයෙහි ලා උපයුක්ත ක්‍රමවේද රාශියක් ත්‍රිපිටක සාහිත්‍යයේ මෙන්ම බෞද්ධ සංස්කෘතිය පුරා විහි දී ඇත. ඒ පිළිබඳව සිදුකරන ලද මෙම පර්යේෂණයේ දී බුද්ධ චරිතය හා සම්බන්ධ ත්‍රිපිටක සාහිත්‍යය අධ්‍යයනය කිරීම, අදාළ ප්‍රස්තුතය පිළිබඳව සාකච්ඡා කිරීම, ස්වයං නිරීක්ෂණය වැනි පරීයේෂණ ක්‍රමවේද භාවිත කරන ලදී.

වියෝදුක සමනයෙහි ලා බෞද්ධ සංස්කෘතිය තුළ භාවිත වන ක්‍රමවේද රාශියකි. ඒ අතර මෘත දේහය ප්‍රදර්ශනය කිරීම, මරණයට පත් වූ තැනැත්තාගේ නිවැසියන් සමඟ ශෝකය බෙදා ගැනීම, ශෝක ප්‍රකාශ කියවීම හා ප්‍රදර්ශනය, ආගමික චාරිත්‍ර කිරීම, ශරීර අවයව අහිමි වූ හා සබඳතා බිඳ වැටුණු අය සමඟ අස්වසාලන සංවාද ඇතිකර ගැනීම හා ඔවුන්ගේ දක්ෂතාවයන් අගය කිරීම ආදිය ඉන් කිහිපයකි.

ත්‍රිපිටක සාහිත්‍ය හා බෞද්ධ සංස්කෘතිය සතු ක්‍රමවේදයන් හඳුනාගත හැකි අතර එහි උපයෝගීත්වය මෙහිලා සුවිශේෂිය. මන්ද එමඟින් ආත්මීය හා බාහිර සාධක ඔස්සේ අස්ථාවර වූ පුද්ගල ජීවිතය යාවත් කාලීන කර ගනු වස් ආත්ම විශ්වාසය ගොඩනගා ගැනීමට, හුදකලා නොවී ජීවිතය ඉදිරියට පවත්වා ගැනීමට, අහිමි වූ දේය ආශිර්වාදයක් කොට ජීවිතය ජය ගැනීමට, යථාර්ථාවබෝධය මඟින් පුද්ගල පෞරුෂය අභිවෘද්ධිදායක කර ගැනිමට ආදි ධනාත්මක ආකල්ප සමුදායක් ඇති වීමට මඟ සලසන බැවිනි. මෙම කරුණු වර්තමානයේ පවා සිදුවන පුද්ගලානුබද්ධ හා සමාජීය ඇතිවන ගැටුම්, ස්වාභාවික විපත් ආදිය තුළින් ඇතිවන වියෝදුක සමනයෙහිලා උපයුක්ත කොට විමසීමෙන් කොතෙක් දුරට මෙය උපයෝගී වන්නේ ද යන්න විශද කළ හැකි බව අපගේ නිගමනයයි.

**ප්‍රමුඛ පදඃ** වියෝදුක, ක්‍රමවේද, උපයෝගීත්වය.

1 පූර්ව උපාධි අපේක්ෂක, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
Email: galagamathero@gmail.com